# හද රිදවන මතක සුවඳ



**රෝහිත මුණසිංහ**
ප්‍රංශයේ සිට



වලදී ප්‍රතිප්‍රහාර නොදී ගුටි කාගෙන දේශපාලනය කලයුතුයි කියලා ? ”
“ඔව් මම හිතන්නේ ඒක හොඳ විධි ක්‍රමයක්” මම පැවසීමි.
“බැහැ. බැහැ. ඒක හරියන්නෙ නෑ. ගැහුවොත් ගහන්න ඕන.”
“අම්මට උඩු. මේ මනුස්සයා ගණන්කාරයා වෙච්ච හැටි.” සත්‍ය වශයෙන්ම එම මොහොතේදීම මට සිතුණේ එලෙසය.
හමුදාවේ හා පොලිසියේ අයට සේවයෙන් අස්වෙන්න යයි දැනුම්දුන් නියෝගය ගැන කථාවට එළඹි කල්හි අමරසිංහ සහෝදරයා දෙන ලද්දේ මා කිසිසේත් අපේක්‍ෂා නොකළ ඉතාම කෙටි අවධාරණාත්මක පිළිතුරකි.
“ඒක නිවැරදි තීරණයක්. ඒ වෙලාවේ කරන්න තිබුණේ ඒක විතරයි.”
මා පක්‍ෂයට ඉදිරිපත් කළ දීර්ඝ ලියවිල්ලේ එම තීරණය නිසා අප ලබන ලද අවාසි සහගත නරක ප්‍රතිඵල ගැන මගේම අත්දැකීම් ඇතුළත් විස්තරයක් ඉදිරිපත් කළෙමි. එබැවින් නැවතත් එම කරුණුම ඉදිරිපත් කිරීමේ තේරුමක් නැතැයි සිතුණ බැවින් මා නිහඬව සිටියෙමි.
1989 වර්ෂයේ අවසන් භාගයේ උදා වූ එම දිනයද එකල උදා වූ අන් සෑම දිනයක් සේම ජන ජීවිතය ගුප්ත අවිනිශ්චිතතාවයක හා අඩමානයක ගිල්වා තිබුණි. එවකට මට උන් සමීපතම මිත්‍රයාත් මමත් අපගේ නිවසේ ආලින්දයට වී කථාබහ කරමින් සිටියෙමු. නිවස ඉදිරිපිටම වූ මහමාවතේ බයිසිකල්කරුවන් කිහිප දෙනෙකු එහා මෙහා යනු මගේ නිරීක්‍ෂණ ඇසට අසුවූයේ යම් අස්වාභාවිකත්වයක් පිළිබඳ හැඟීමක් මසිතට දනවමිනි. මිනිත්තු දෙක තුනක් ගතවෙන්නට ඇත. නිවසේ ආලින්දයට අනවසරයෙන්ම හිටි හැටියේ ගොඩවයේ තරුණයන් දෙදෙනෙකි. මට වහා තැතිගැන්මක් ඇතිවුයේ මගේ ඥාතියෙකු ද වන මිත්‍රයා පොලිස් නිලධාරියෙකු වන නිසා ය.
“මේ ගෙදර එක්කෙනෙක් පොලිසියේ වැඩ කරනවා. අද ඉඳලා සති දෙකක් ඇතුළත එයාට පොලිසියෙන් අස්වෙන්න කියලා දැනුම් දෙන්න ඕන.”
“පොලිසියේ ඉන්නේ මගේ මල්ලි. එයා කසාද බැඳලා දරුවෙකුත් ඉන්නවා. රස්සාවෙන් අස්වෙලා ජීවත් වෙන්නේ කොහොමද ?” මම විමසා සිටියෙමි.

“ඒක අපි දන්නෙ නෑ. පොලිසිය කියන්නේ ජනතාව මර්ධනය කරන රාජ්‍ය ආයතනයක්. එකේ රාජකාරි කරන එක දේශද්‍රෝහී වැඩක්. ඔහේලා මේ නියෙ-ෝගය එයාට දන්වන්න ඔනේ.”
“දන්වන්න නම් පුළුවන්. හැබැයි රස්සාවෙන් අස්වන නොවෙන එක එයාගේ තීරණයක්.”
“අස් නොවුනොත් පවුලේ මිනිස්සුන්ට කරදර විඳින්නට සිද්ධ වේවි.”
“ඒක සාධාරණ නැහැනේ සහෝදරයා. කසාද බැඳලා පවුලෙන් වෙන් වෙච්ච මිනිහෙකුට අපි කොහොමද බලපෑම් කරන්නේ ?”
මේ අවස්ථාවේ තෙවැන්නෙකුද ආලින්දයට ගොඩවිය. පළමු පැමිණි දෙදෙනා මා නොහඳුනතත් ඔහු මා හඳුනා ගත්තේ ය. “යමු යමු හරි හරි” සිය සගයන් දෙදෙනා කැඳවාගත් ඔහු මොහොතක්වත් නොරැඳී වහාම පිටවී ගියේ ය.
“අපේ ගෙදරටත් යන්න ඇති. ඒ වැඩේ නම් උඹලට තියෙන සපෝට් එකත් නැතිවෙන වැඩක්. උඹලගේ පක්ෂයෙන්ම ඇවිල්ලා උඹලට තර්ජනය කරලා යනවා.” මිත්‍රයා පැවසීය.

මට මහා ලැජ්ජාවක් ද කණගාටුවක් ද දැණිනි. මගේ මල්ලි පක්ෂයට සම්බන්ධ වී උන්නේ පොලිසියට යාමටත් පෙරදී ය. ඔහුගේ ප්‍රගතිශීලී අදහස් හෝ මනුස්සකම දියකර හැරීමට පොලිසියට නොහැකිවිය. මහනුවර පොලිසියේ සේවය කරමින් සිටි ඔහු විප්ලවවාදීන් කෙරේ දක්වන අනුකම්පාව හේතුවෙන් කෲර මර්ධන උඩුගම්පොළගේ සැකයට භාජනය විය. ඔහු මල්ලිගේ ජීවිතය විනාශ කිරීමට උත්සාහ කළද භාස්කමකින් මෙන් එය වැළකිණ. පසුව මල්ලීගේ වැඩ තහනම් කරන ලදුව පොලිසියේ හිරකුටියකම මාස තුනක් හිරකර තැබී ය.

මගේ පොලිස් මිත්‍රයා හැමදමත් යූ.ඇන්.පී. විරෙ-ෝධියෙකි. සමාජවාදී අදහස් දරන්නෙකි. වෛද්‍යවරයෙකු වු ඔහුගේ සොහොයුරා පක්ෂයේ හිතවතෙකි. සිය සොයුරාගේ දේශපාලනය නිසාද, මා සමඟ ඇති අඛණ්ඩ සබඳතාවය නිසාද ඔහු ඒ වනවිටත් රහස් පොලිසියේ ප්‍රශ්න කිරීම්වලට භාජනය වී සිටියේය.

දේශප්‍රේමී සොයුරන් අප නිවසින් බැහැරව අඩ හෝරාවක් යන්නට ප්‍රථමයෙන් මගේ නැන්ද කෙනෙකු අප නිවසට ආයේ හඬාගෙන ය.

“ඒ ළමයි ගියපු ගමන් තමයි මම මේ දුවගෙන ආවේ. පොලීසියේ ඉන්න ළමයි දෙන්න අස්කර ගන්න කිව්වා. මම කරුණු කිව්වාම, ළමයි අස්කර නොගත්තොත් ගෙවල් දොරවල් නැතිවෙන්න පුළුවන්ය කිව්වා. පුතා දන්නවනේ අපි කොයිතරම් අමාරුවෙන්ද කියලා ඔය ගේ හදගත්තේ ?”

මා හමුවෙන්නට පැමිණ එසේ පැවසුවේ අභයගුණගේ අම්මාය.

“නැන්ද බය වෙන්න එපා. මම ඒක බලාගන්නම්.” මම ඇය අස්වැසීමි.

මාතර එළියක්ද වධ කඳවුරේ එක කොටසක් පිහි-ටුවා තිබුණේ පැරණි ගුරු අභ්‍යාස විදුහලේ ගොඩනැගිල්ලකය. මා ඇතුළු සිය ගණනක් එහි වු ඉතාම කුඩා ගොඩනැගිල්ලේ කාමර දෙක තිරිසනුන්ටත් අන්ත ලෙස ගාල්කර සිටි අතර, යාබද වු අනෙක් ගොඩනැගිලිවල රඳවා හිටියේ හමුදාවේ පවුල්වල සාමාජිකයන් ය. දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ තර්ජනය දඩමීමා කරගෙන රජය විසින් දෙගුණ තෙගුණ කරන ලද භීතියක් හා සන්ත්‍රාසයක් මවා පෑමෙන් පසුව හමුද පවුල් සිය නිවෙස් තාවකාලිකව අත්හැර රජය විසින් ආරක්ෂාව සපයන මෙවැනි රැකවරණ ස්ථානවලට පැමිණියහ. එම ගොඩනැගිලි වලට නිසි වේලාවට අවශ්‍ය පමණ නළ ජලය සැපයුවේ නැත. පිටතින් ගෙන එන ලද පිළියෙල කරන ලද කෑම, බීම නිසා වේලාවට නොලැබුණ වාර ඕනෑ තරම් විය. කෑම ප්‍රමාද වී කුසගින්නේ කෑමොරදී හඬන දරුවන්ගේ හඬ අපට නිතර ඇසිණ. විවිධ දුෂ්කරතා වලින් යුතු මෙම ජීවිතයෙන් මිදී තම ගම්බිම්වලට හා ගෙවල් දොරවල්වලට යන්නේ කුමන මොහොතේදී දැයි මේ හමුද පවුල්වල සාමාජිකයන් සිහින මවන්නට ඇත. තමන්ට තම ගෙවල් දොරවල්වලට ගොස් හිතේ බයක් නැතිව ජීවත්විය හැක්කේ දේශප්‍රේමී ව්‍යාපාරය මර්ධනය කළ දවසට නිසා මොවුහු හමුදවේ සිටින තම ඥතියාට එම කාර්යය සඳහා බලකරන්නටත් ඇත. ජ.වි.පෙ. දෙස සානුමකම්පිත, හිතවත් දෘෂ්ටියකින් බැලු හමුද සාමාජිකයන්ට පවා තම පවුල්වල මිනිසුන් විඳින මේ දුෂ්කරතාව නිසා ජ.වි.පෙ. මැඩ පැවැත්විය යුතුයයි හෝ විනාශ කළයුතුයයි හෝ සිතෙන්නට ඇත.

මා පක්ෂයට ඉදිරිපත් කරන ලද ලියවිල්ලේ සඳහන් කලේ මවිසින් අත්විඳින ලද්ද වු ඉහත සඳහන් ජීවමාන උදහරණ කිහිපයකි.

“පක්ෂය සහෝදරයෝ ගැන නොසලකා හිටියේ නෑ. සී. අයි. සහෝදරයයි මමයි (සී. අයි. ප්‍රනාන්දු, ලන්ඩන් ශාඛාවේ සභාපති) ධගතගජගසෟග්ග එක සමඟ කරපු විශේෂ සාකච්ඡාවකදී සහෝදරයාට ‘පොලිටිකල් එසයිලම්’ දෙන්න කියලා ඉල්ලීමක් කළා. මේ එද අපි ගත්ත පින්තූරයකි”.

අමරසිංහ සහෝදරයා දිනපොත තුළින් ගත් ඡායාරූපයක් මට පෙන්විය. ධගතගජගසෟග්ග ආයතනය ඉදිරිපිටදී ගත් එහි සිටියේ ඔවුන් දෙදෙනා ය.

මා ගැන සැලකිලිමත්වීම සම්බන්ධයෙන් මම අපගේ නායක සොයුරාට ස්තූති කලෙමි. අමරසිංහ සහෙ-ෝදරයා සමඟ කරන ලද දීර්ඝ සාකච්ඡාවෙන් මට තිබු ප්‍රශ්න හා ගැටලු මුළුමනින් නොවිසඳුන නමුදු පක්ෂයේ වැඩ කිරීමට මම තිරණය කළෙමි. එම පළමු හමුවෙන් පසුව තවත් දෙවාරයක් හෝ තුන්වාරයක් මට අමරසිංහ සහෝදරයා මුණ ගැසිණ. එක් අවස්ථාවක් වුයේ පක්ෂයේ සාමාන්‍ය හිතවතුන් කැඳවා පවත්වන ලද සාකච්ඡාවකි. මේ සාකච්ඡාවට දසරත්න හා මාස්ටර් පැමිණියේ මගේ දැනුම් දීමෙනි.
අභයගුණ මේ වනවිට ව්‍යාජ ජේ.වී.පී. වෙස් මුහුණ හා සළුපිලි ගලවා දමා සිය අවස්ථාවාදී රංගනය නිමවා

***<u>චමී හා විභූති වීදිය බණ්ඩාර’ යන නම්වලින් හැඳින්වු විමල් වීරවංශ සහෙ-ෝදරයා සහ ‘සුමේද’ නමින් හැඳින් වු නන්දන ගුණතිලක සහෝදරයා සමඟ එක්ව වැඩකල ශිරෝමන් සහෝදරයා මානව හිමිකම් සුරැකීමේ සංවිධාන සමඟ ද සබඳතා පැවැත්විය.</u>***

නිරුවත්ව සිටියෙන් මෙවැනි සාකච්ඡාවකට හෝ නො-පැමිණියේය.

තවත් අවස්ථාවක් වුයේ රෝහණ විජේවීර සහෝදරයා ප්‍රමුඛ දිවිපිදු සහෝදරවරුන් සමරන ඉල්මහ සමරු-වයි. මෙම අවස්ථාවට සහභාගී වුයේ පැරිසියේ පක්ෂ කමිටුවේ සාමාජිකයන් පමණි. අමරසිංහ සහෝදරයා ප්‍රධාන දේශනය පැවැත් වු අතර අප සැම දෙනාම ඔහුට පෙර කෙටි කථාවක් බැගින් පැවැත්වුවෙමු. මගේ විශ්වාසය පරිදි අමරසිංහ සහෝදරයා හැරුණු කොට පක්ෂයේ පැරණි සාමාජිකයෙකුට ඒ තැන සිටියේ මා පමනි.

“සහෝදරයා, ගමනායක සහෝදරයා හිටපු තැන හමුදවට කිව්වේ රෝහණ සහෝදරයයි කියලා කථාවක් පැරිසියේ තිබුණා. ඒකෙ ඇත්ත තත්ත්වය මොකක්ද?”

එම ප්‍රශ්නය නැගුවේ පැරිසියේ පක්ෂයට සම්බන්ධ වු සොයුරෙකි. “1989 නොවැම්බර් 11 වෙනිදත් දේශපාලන මණ්ලය රැස්උනා. එතකොට අපිට තොරතුරු ලැබිලා තිබුණා එච්. බී. හේරත් සහෙ-ෝදරයයි, ඩී. එම්. ආනන්ද සහෝදරයයි හමුදවට අහුවෙලයි කියලා. ඒ වේලාවේ සමන් පියසිරි ප්‍රනාන්දු සහෝදරයා බල කරලම කිව්වා අද කවුරුවත් හිටපු තැන්වලට යන්න එපා වහාම නවාතැන් වෙනස් කළයුතුයි කියලා. අපි විසිරිලා යන්න හදද්දී මම හිටපු තැන ඇඩ්රස් එක පොඩි කොල කෑල්ලක ලියලා රෝහණ සහෝදරයාගේ අතට දීලා කිව්වා. “අද ඉඳලා මම ඉන්නේ මෙතැන කියලා ” ඉතින් රෝහණ සහෙ-ෝදරයා ගමනායක සහෝදරයා පාවල දුන්න නම් මම බේරෙන්න විදියක් නැහැනේ”

මේ විස්තරය අවසානයේදී අමරසිංහ සහෝදරයාට කථාකර ගැනීමට නොහැකි විය. ශිරෝමන් සහෙ-ෝදරයා දුවගොස් වතුරු වීදුරුවක් ගෙන ආවේය. අපගේ පළමු හමුවේදී අමරසිංහ සහෝදරයා මට දන්වා තිබුනේ ‘බ්‍රෙගුඒ සාබැන්’ උමං දුම්රිය පොළේ උමං ද්වාරය අසලදී මුණ ගැසෙන ලෙසය. මම උමංකඩ ළඟට වී බලා සිටියේ ඔහු එතුළින් පිටතට පැමිණෙන තුරුය. එහෙත් ඔහු මා වෙතට ආවේ මා බලාපොරොත්තුව නොසිටි වෙනත් දිසාවක සිටයි. අපගේ සාකච්ඡාව අවසානයේ වෙන්වීම සිදුවුයේ ද ඒ ආකාරයටමය.

“එහෙනම් සහෝදරයා යන්න රෑත් වෙනවනේ. මම පුන්සිරි සහෝදරයා එනතුරු මෙතනම ඉන්නම්”

මා පිටත්ව ආවේ අමරසිංහ සහෝදරයා කෝපි අවන්හලේ සිටියදීමය. ඔහු මට පසුව පිටතට පැමිණ කොයි දෙස යන්නේදැයි බලාගැනීමට උවමනාවක් තිබුනේ නම් මට සැඟවී බලා සිටීමට හැකියාව තිබිණ. එහෙත් මට එවන් උවමනාවක් නොවීය.

අමරසිංහ සහෝදරයා පැමිණි පසු සාකච්ඡාවලදී ද ඔහු පිටත්ව ගියේ යනබව කියා කිසිවෙකුගෙන් සමුගෙන නොවේ.

සාකච්ඡාව අවසාන වී රට තොට තොරතුරු කථා කරමින් සිටින පිරිස වරින් වර ශාලාවෙන් පිටත වු වැසිකිළියට යන්නේ මුත්‍රා කිරීම සඳහාය. මා මෙන්ම අන් අයද සිතන්නට ඇත්තේ අමරසිංහ සහෝදරයා කාමරයෙන් පිටතට ගියේ වැසිකිළියට යාම සඳහා බවය. එහෙත් ඔහු කිසි-වෙකුගෙන් සමුනොගෙනම පිටත්ව ගොස් තිබිණ.

සෝමවංශ අමරසිංහ සහෝදරයා දිවිරැක ගත්තේ ඔහු තුළ පවතින මේ අති සුක්ෂ්මතාවය නිසාවෙනැයි මට ඒ වනවිටත් අවබෝධව තිබිණ.

ජාත්‍යන්තර කම්කරු දිනය හෙවත් මැයි පළමුවැනිදට දේශපාලන පක්ෂ විස්සක් හෝ විසිපහක් වෙන වෙනම පළමුවැනිදාට දේශපාලන පක්ෂ විස්සක් හෝ විසිපහක් වෙන වෙනම තැනින් තැන පවත්වන පෙළපාලි හා රැස්වීම් තොගයක් දැක පුරුදු අපට ප්‍රංශයේ මැයි පෙළපාලිය අලුත්ම අලුත් නවමු අත් දැකීමකි. වටිනා ආදර්ශයකි. පැරිසියේ රිපබ්ලික් චතුරස්‍රයේ ඇති නිදහසේ ප්‍රතිමාව අසලින් ආරම්භ වන මැයි පෙළපාලියේ ප්‍රංශයේ සියලුම දේශපාලන පක්ෂවල හා සියලුම වෘත්තීය සමිතිවල සාමජිකයන් තම තමන්ගේ ධජපතාක යටතේ එකට ගමන්කර එකම අවසානයකදී විසිර යති. ප්‍රංශයේ දේශපාලන පක්ෂ පමණක් නොව වෙනත් රටවල දේශපාලන පක්ෂද යන්නේ මෙම පොදු පෙළපාලියේය.

පිරුබාහරන්ගේ විශාල ප්‍රමාණයේ කටවුට් ඡායාරූපයක් පෙරටු කොටගත් එල් ටී ටී ඊ (කොටි) සංවිධානය ද මෙම පෙළපාලියට වසර කිහිපයක් තිස්සේම සහභාගි වෙයි. ජනතා විමුක්ති පෙරමුණ පැරිසියේ මැයිදින පෙළපාලියට පළමුවරට සහභාගී වන්නේ 1993 දීය.

ඒ වනවිට පැරිසියේ ජ.වි.පෙ. සංවිධායකව සිටි ඩේවිඩ්සන් සංවිධායක තනතුරින් ඉවත් කොට තිබුණි. නව සංවිධායකවරයා වුයේ ශිරෝමන්ය. ඔහු ඩේවිඩ්සන්ට වඩා තරුණ, ක්‍රියාශීලි පුද්ගලයෙකි. පක්ෂය පැත්තෙන් ගත්කල ඩේවිඩ්සන්ගේ පසුකාලීන ක්‍රියාකලාපය කොතරම් මතභේදත්මකවීද, ශිරෝමන්ගේ සමහර ගතිගුණද එපමණටම මතභේදත්මක විය.

නාමිකව මෙන් පැරිසියේ සංවිධායක වශයෙන් සිටියද තමා කළයුතු නිශ්චිත කාර්යයක් ගැන ඩේවිඩ්සන් නොදැන සිටියේය. තරුණ වයස ඉක්මයමින් සිටි තරමක් සුකුමාල ගති පැවතුම් ඇති ඩේවිඩ්සන් කථාව ප්‍රියකල පුද්ගලයෙකු වුයෙන් ඔහු කරන ලද්දේ තමාට සම්බන්ධකම් පැවැත්විය හැකි පක්ෂයේ හිතවතුන් සමඟ පැය ගණන් වරු ගණන් දුරකථන සංවාදවල යෙදී සිටිමය. මෙම සංවාද වැඩකට නැති වල්පල් හා ඕපාදුව වලින් ද සමන්විත විය. මෙහි ප්‍රතිඵලය වුයේ පක්ෂයේ හිතවතුන් ගෙන් ලැබෙන ආධාර ද ඔහු උපයන මුදල්වලින් ගෙවාගත නොහැකි තරම් විශාල දුරකථන බිලක් ඔහුට ලැබීම ය. පක්ෂයේ සංවිධායක මෙන් ද දේශපාලන වැඩ කටයුතු වලින් ද ඉවත්වීමට ඔහුට බලවත් ඕනෑකමක් තිබු බවට අවබෝධ වුයේ අපගේ පළමු හමුවේදීය. එබැවින් මෙම ඉවත්කිරීම ඉබ්බා දියේ දැම්මාක් මෙන් ඔහුට සනීපදයක වුවාට සැකයක් නැත. සෝමවංස අමරසිංහ සහෝදරයාට ප්‍රංශයට පැමිණීමෙන් පසු ඇතිවන වාතාවරණය ඩේවිඩ්සන්ට අඬන්නට හිටි එකාට ඇහැට ඇඟිල්ලලෙන් ඇන්නාක් මෙන් විය. එහෙත් ඔහු අනුගමනය කරන ලද්දේ යන යකා කොරහත් බිඳගෙන යාමේ දුෂ්ඨ ප්‍රතිපත්තියකි.

ශිරෝමන්ගේ දේශපාලන ඉතිහාසය ගැන මා දැන සිටියේ අල්පයකි. විශ්ව විද්‍යාල ශිෂ්‍යයෙක් ලෙස සමාජවාදී ශිෂ්‍ය සංගමය හරහා පක්ෂයට සම්බන්ධ වී සිටි ඔහු වැදගත්ම වැඩ කොටසක් කරන ලද්දේ පක්ෂය විනාශයට ලක්වීමෙන් අනතුරුව එළඹුණ දුෂ්කර කාලයේදීය. ‘චමී හා විභූති වීදිය බණ්ඩාර’ යන නම්වලින් හැඳින්වු විමල් වීරවංශ සහෝදරයා සහ ‘සුමේද’ නමින් හැඳින් වු නන්දන ගුණතිලක සහෝදරයා සමඟ එක්ව වැඩකල ශිරෝමන් සහෝදරයා මානව හිමිකම් සුරැකීමේ සංවිධාන සමඟ ද සබඳතා පැවැත්වීය. කෙසේ වුවද පැරීසියේදී නම් ඔහු හැසිරුණේ යකා වැහුනු ආකාරයෙනි. පක්ෂයේ ශිෂ්‍ය අංශයේ සහෝදරයෙකු වූ ශිරෝමන්ගේ වෙනස මට හොඳට වැටහුණේ ගැමුණු (ගයාන්)